**දෙවන වාර පරීක්ෂණය - 2024**

**සිංහල භාෂාව හා සාහිත්‍යය( 1 - පත්‍රය )**

**10 ශ්‍රේණිය**

**I පිළිතුරු පත්‍රය**

| ප්‍රශ්න අංකය | **පිළිතුරු** අංකය |
|---|---|
| 1 | 4 |
| 2 | 1 |
| 3 | 3 |
| 4 | 4 |
| 5 | 2 |
| 6 | 2 |
| 7 | 4 |
| 8 | 3 |
| 9 | 3 |
| 10 | 3 |
| 11 | 2 |
| 12 | 3 |
| 13 | 4 |
| 14 | 1 |
| 15 | 3 |
| 16 | 4 |
| 17 | 2 |
| 18 | 3 |
| 19 | 4 |
| 20 | 3 |
| 21 | 2 |
| 22 | 3 |
| 23 | 2 |
| 24 | 4 |
| 25 | 2 |
| 26 | 3 |
| 27 | 2 |
| 28 | 3 |
| 29 | 1 |
| 30 | 4 |
| 31 | 2 |
| 32 | 4 |
| 33 | 1 |
| 34 | 2 |
| 35 | 4 |
| 36 | 2 |
| 37 | 3 |
| 38 | 1 |
| 39 | 3 |
| 40 | 1 |

**පිළිතුරු පත්‍රය**

**ii සිංහල භාෂාව හා සාහිත්‍ය**

**දෙවන වාර පරීක්ෂණය - 2024**

01) I. අ) සඤ්ඤක ආ) (අ)ං - අනුස්වාරය
(අ)ඃ - විසර්ගය

II. අ) ෆැන්ටා, ෆොන්සේකා, ටොෆි
ආ) මජ්ඣිම, ගිජ්ඣකූට, සජ්ඣායනය

III. අ) පහන - පහන්
ආ) බලවයි - බල

IV. අ) කරහල්ලා ආ) දැවා

V. අ) මාලිගාව, ගෙය,සරය, නිවාසය
ආ) ගිර, උච්චය, පව්ව, පර්වතය

VI. අ) ජනාකීර්ණ ආ) නේවාසික

VII. අ) ශිල්පියකු ආ) ඔවුහු

VIII. අ) වෛද්‍යවරයා විසින් රෝගීහු සුවපත් කෙරෙති/කරනු ලැබෙති/කරනු ලබති.
ආ) ළමයින් විසින් පොත් කියවේ/කියවෙයි/ කියවනු ලබයි/කියවනු ලැබෙයි.

IX. අ) නාට්‍ය ධර්මී නාට්‍යය (ශෛලිගත සම්ප්‍රදාය)
ආ) ලෝක ධර්මී නාට්‍යය (ස්වභාවික ශෛලිය)

X. අ) උපමානය - රත්ව ගිය යවට උපමේය - ඇස්

02) අදාළ රචනාවට අනුව ලකුණු ලබා දෙන්න.

03) අපේක්ෂිත ප්‍රධාන අදහස් ඃ-

- සිංහලයාගේ බිහිවීම් ආර්යන්ගෙන් සිදු වූ බව
- ලාංකික කුල ක්‍රමය ඉන්දියාවෙන් ලද බව
- අනුරාධපුර යුගයේ එය ප්‍රබලව පැවති බව
- ඉන්දියානු ජන සමාජය ප්‍රධාන කුල හතරකින් යුතු බව
- මේ පිළිබඳ විස්තර සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන්ව ඇති බව

මේ කරුණු ඇත්දැයි බලා ලකුණු පිරිනමන්න.

04)

I. උන්ගේ වාස භූමි විනාශ වීම./ උන්ට යන එන මං නොමැති වීම./තම ජන්ම භූමියේ උරුමය අහෝසිවීම.

II. මනුෂ්‍යයා හා වානරයා අතර සමීප සම්බන්ධයක් ඇති බවයි.

III. අප්‍රිකාවේ මහා වනාන්තර

IV. චිම්පන්සීන් යනු මහා වානරයාගේ විශේෂිත උප සත්ත්ව කොට්ඨාසයන්ය යන්නයි.

V. උරුමය - අයිතිය
ජන්ම භූමිය - උපන් බිම

05) සුදුසු පරිදි ලකුණු පිරිනමන්න.

## iii පිළිතුරු පත්‍රය.

01. I (අ) පාලි ජාතකට්ඨ කථාව

(ආ) කුරුණෑගල අවධිය

II (අ) පන්සිය පනස් ජාතකය

(ආ) චූලනී බ්‍රහ්ම දත්ත රජුට

III (අ) කෝට්ටේ යුගය

(ආ) සලාවත ජයපාල

IV (අ) මූසිල

(ආ) වැත්තෑවේ හිමි

V (අ) සුර ගඳඹුන් ලෙසට

(ආ) පටන් ගෙන වෙන ගායනාවට

VI එක් වීම - උපමේය උක් දණ්ඩේ පැණි - උපමේය

වෙන් වීම - උපමේය යක් දෙබරේ වද - උපමාව

VII (අ) ලෙනාඩ් වුල්ෆ් මහතා

(ආ) හම්බන්තොට

VII (අ) ඒ.පී.ගුණරත්න මහතා

(ආ) සිලිඳු

IX (අ) උපදේශාත්මක ජන කවි/දැනමුතුකමට කී කවි

(ආ) සෑම ජාතියකටම ඔබින/සෑම කාලයටම ගැළපෙන

X පෑම තමයි සුරු විරු කම්

ජාතික තොටිල්ල/ජාතික තොට්ල්ල හෙවත් දරු නැළවිල්ල

02. I (අ) කේවට්ට

(ආ) පණ්ඩිතයෙනි,තොපට සුදුසු පඩුරත් සොයන්නෙමි

අද මේ මිණි රුවන ලදිමි හැර ගනුව.

II (අ) රුස් වූහ සන්තෝෂයෙන්ම/ආශාවෙන්ම

(ආ) ගුරුළෝ හා නාගයන් වෛරය අමතක කර ළඟටම වී සිටීම

III (අ) බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත

පනින රිලවුන්ට ඉනිමං කමක් නැත

(ආ) වයස යන විටත් පින් දහම් වල නිරත විය යුතු බව.

IV (අ) පුංචි මාණිකා

(ආ) පුංචි මැණිකාගේ සැමියා වන බබුන් බොරු නඩුවකට පටලවා හිරේ ගොස් මාස ගණනක් පසුවිත් ආපසු නොඒම පිළිබඳව රාළහාමිගෙන් විමසන අවස්ථාව.

03. I ගුත්තිල ඇඳුරුතුමාගේ වීණා නාදයේ මිහිරියාව ධ්වනිත කිරීම සඳහා එම වීණා නාදයට සවන් යොමුකළ සතුන්ගේ මෙන්ම මිනිසුන්ගේ ඉරියව් වල ඇතිවන වෙනස්කම් දැක්වීමට කවියා උචිත කාව්‍ය උපක්‍රම රැසක් ගනියි.

ඇතුන්, අශ්වයින්, කුරුල්ලන්, මාළු, රිලවු ස්වභාවයෙන් ම චංචලකාරි ඉරියව් වලින් යුක්තය. ගුත්තිල ඇඳුරුතුමාගේ වීණා නාදය පැතිරෙද්දී එය සවන් වැකුණු චංචලකාරී සතුන්ගේ ඉරියව් වෙනස් වී නිශ්චල විය. ඔවුන් නිසොල්මන්ව වීණා නාද අසා සිටියහ.

උදා : ''මද සතිසුන් පියොවින් සිටි නොසැලී
ගජසෙන් සිතියම් ගජසිරි කියෙලී''
''සන්සල නොව එහි පිළිරූ ලෙසිනේ
නන්හය සෙන් සිටියෝ සිටි මතිනේ''
''නන් දන කැන් දුටුවද බිය සිස්වු
මීන් රළ උත් ගං වෙරළට රැස්වු''
''පුරඹර වසමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනගට සුරසුන් පැන වූ වැනි''

(ගැළපෙන වෙනත් උදාහරණද ගෙන විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

සතුන්ගේ පමණක් නොව මිනිසුන්ගේ ඉරියව් වල වෙනස්කම් ද පාදක කරගනි. රජුගේ සේනාව අත තිබුණු ආයුධ බිම වැටුණ බවත් පුරගනන්ගේ ඇකයේ සිටි දරුවන් බිම වැටුණ බවත් කවියා දක්වයි.

උදා : ''අතිනවි ගිලිහෙන බව නොම දත්තේ ''
''නොදනිත් දරුවන් ඇකයෙන් වැටුණා''

II කවියා මෙහි යොදාගත් ''ගජසෙන් සිතියම් ගජසිරි නියොලී'' ''සුරසෙනගට සුරසෙන් පැනවූ වැනි'' ''සන්සල නොව එහි පිළිරූ ලෙසිනේ '' යන උපමා උපමේයන් මෙන්ම ''දැමුවෙන් වෙණ නදමය මියුරායා'' යන කාව්‍ය යෙදුම් වලින් ද පාඨක සිත්තුළ අපූර්ව චිත්තරූප සමූහයක් සිතුවම් කිරීමට කවියා සමත් විය.

( මෙවැනි ගැළපෙන වෙනත් උදාහරණද පාඩම ඇසුරෙන් යොදා ගෙන විස්තර කළ හැක.)

03. නැතහොත්,

උපක්‍රම ශීලී බවින් කේවට්ට බමුණාත් මහෞෂධ පඬිවරයාත් අතර සමාන ගති ලක්ෂණ දක්නට ලැබේ.

කේවට්ට බමුණා චූලනී බ්‍රහ්ම දත්ත රජුගේ අග්‍ර පුරෝහිත වෙයි. '' ඌ තුමූ නුවණැත්තාහ ....'' යනුවෙන් දක්වන අදහසින් ඔහු නුවණැති පඬිවරයකු බව පැහැදිලි වෙයි. මහෞෂධ පඬිවරයා මියුලු නුවර වෛදේහ රජුගේ අග්‍ර පුරෝහිතයා වෙයි. ''ම පුතුන් මහෞෂධ පණ්ඩිතයන් විණා මා මේ දුකින් මුදනට තවත් කෙනෙක් නැතැයි'' යනුවෙන් බ්‍රහ්ම දත්ත රජුගේ සේනාව මියුලු නුවර වටලන අවස්ථාවේ වෛදේහ රජුගේ සිතිවිලි වලින් මහෞෂධ පණ්ඩිතයන් ඉතා නුවණැති පුද්ගලයෙක් බව පැහැදිලිය.

කේවට්ට බමුණා රහස් මන්ත්‍රණයට උපක්‍රමශීලීව සැරසෙයි.

''දේවයන් වහන්ස නුඹ වහන්සේගේ කන මැතට නමා ලුව මැනවි.''

රහස් මන්ත්‍රණය කුමක් දැයි දැනගැනීමට ගිරවෙකු යොදා ගැනීමට මහෞෂධ පණ්ඩිතයන් උපක්‍රමශීලී වෙයි.

'' මේ එක් කාරණයක් වුව මැනවි''

යුද නොවැදී කුඩාම රාජ්‍යයේ සිට විශාල රාජ්‍යයන් දක්වා යටත් කර ගැනීමට කේවට්ට උපක්‍රම ශීලීවෙයි.

අපි සේනාව රැස්කොට පළමුව කුඩා නුවරත් වටකොට ගනුම්. මහෞෂධ පණ්ඩිතයන් මියුලු නුවර එයින් බේරා ගැනීමට උපක්‍රමශීලීව කටයුතු කරයි.

''ඇතුළු නුවර උන් දිළිඳුන් පිටත් කරවා.....''

( පාඩම ඇසුරෙන් මෙවැනි අවස්ථා දක්වා පැහැදිලි කර ඇතිනම් ලකුණු ලබා දෙන්න)

II ඔවුන්ගේ අපේක්ෂාවන් අතර පරස්පර විරෝධී බවක් දක්නට ලැබේ.

කේවට්ට බමුණ කපටි කමින් සිය බුද්ධිය ආත්මාර්ථකාමී අරමුණු වලට මෙහෙයවයි. එක් සියයක් රජ දරුවන් මරා චූලනී බ්‍රහ්ම දත්ත රජු මුළු දඹදිවටම අගරජ කිරීමෙන් කේවට්ට බමුණා මුළු දඹදිව අග්‍ර පුරෝහිතයා වීමත් ඔහුගේ අපේක්ෂාවයි. මහෞෂධ පණ්ඩිතයන් සිය බුද්ධිය පරාර්ථකාමී අරමුණුවලට මෙහෙයවන සැම දෙනාගේම ප්‍රසාදයට ලක්වන දූරදර්ශී පණ්ඩිතයෙකි. මියුලු නුවර යටත් කර ගැනීමට ඉඩ නොතබන අතර එක් සියයක් රජ දරුවන්ගේ ජීවිත බේරාගැනිමට ද මහෞෂධ පණ්ඩිතයන නොපසුබට වෙයි.

(පාඩම ඇසුරෙන් උදාහරණ දක්වන්න)

04. I පද්‍ය පන්තිය ආරම්භයේදීම මහින්ද හිමියන් අප රටේ බෞද්ධ උරුමයන් සිහිපත් කරයි. බුදු දහමෙන් පෝෂණය වූ යන අභිමානය ඇති කරයි.

''මුණි සිරිපා සිඹිමින්නේ
සමනොළ ගිරි පෙදසින්නේ ''

ඕනෑම පුද්ගලයෙකුට තම ජාතියක් අදහන ආගමක් ගැන ඇත්තේ මහත් අභිමානයකි.

''ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ''

තම ජාතිය වෙනුවෙන් සංග්‍රාම භූමියේ දි ජීවිතය පූජා කිරීම මහත් ආඩම්බරයෙක් ලෙස සිංහලයෝ සිතති.

''ජාතික රන් දෙරණ මතේ
ගැටි වැටි මළ මොහොතේ ''

(ජාතිකාභිමානය ඇති කරවන මෙවැනි පද්‍ය පාඩමෙන් උපුටා ගෙන විස්තර කර ඇතිනම් ලකුණු ලබාදෙන්න)

II මුණි සිරිපා පහසින් සිප එන මද නලින් නැළවෙන දරුවනට තමා ලැබූ ජීවිතයේ ප්‍රයෝජනයක් හා වටිනාකමක් ඇත්තේ රට, ජාතිය, ආගම වෙනුවෙන් සේවයක් කළොත් පමණක් බව මහින්ද හිමි සිහිපත් කරයි.

''තමන් ලැබූ දිවිපෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකොළොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ ''

රට වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමේ දී ගැරහුම් ලබන්නටද සිදු වේ. ඒවා ද ඉවසන්නට පුරුදු විය යුතු බව උන්වහන්සේ පෙන්වා දෙයි.

''ඉටුකොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
නුඹයි මගේ පුතා උතුම්''

කාටත් පොදු දෙයක් වශයෙන් නැති බැරිකම් මෙන්ම අගහිගකම් පෙන්වා දෙන උන්වහන්සේ ඒවා මැඩගෙන දස්කම් පෑම සුරු විරුකමක් ලෙස දක්වයි.

සමාජයේ යහපැවැත්ම සඳහා මිත්‍රත්වයේ ඇති වටිනාකම ද පෙන්වා දෙයි.

''මිතුරුකමින් පෙරට එතොත්
දූවිල්ලක් එක්ක වුණත්
මිතුරු වෙයන් පුතේ නුඹත්
එයයි ලොවේ ගුණය මහත් ''

(පුද්ගල චරිත සංවර්ධනයට මෙවැනි උදාහරණ, වෙනත් උදාහරණ පාඩමෙන් උපුටාගෙන පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න)

04. නැතහොත්,

I බැද්දේගම ගම දිනෙන් දින පරිහානියට පත් වූ ආකාරය.

සිළිඳු මරණීය දණ්ඩනයට පත් කිරිමෙන් පසුව ගමේ පැවති ස්වභාවික තත්වය කතුවරයා මෙසේ විස්තර කරයි.

''ක්‍රමයෙන් පිරිහී ගොස් අවටින් නෙරපාගෙන.............. එක පහරකට එක දවසින් ගෙවල් හයෙන් එකක් නැතිවිය.''

''පදිංචිය හැර දැමූ ආරච්චිගේ නිවස බිත්ති අතර කැලය වැඩී ගෙය ඔබා ගත්තේ.........''

''ආරච්චිගේ ගෙය කැලයට යාම කැලය ගම මැදට කඩා පැනීමක් මෙනි.

II එහි ජීවත් වූ වැසියන් පරිහානියට පත් වූ බව නිරූපණය කරන ආකරය.

පුංචි මැණිකාගේ නැන්දණිය වූ කරලින්හාමි සිරුර වැහැරී යන ගැමියන්ගේ සංකේතයකි.

''තද සුළඟට ඇඹර වී ඇටුවන් බැසී ගිය ගසක් මෙන් ඇගේ ශරීරය නැමී ඇඹරී තිබිණි.''

මේ ගමේ වැසියන්ගේ කායික පිරිහිමට පෙර මානසික පිරිහෙයි.

ශරීරයට පෙර සිත නැති වී යාම වශයෙන් කතුවරයා නිරූපණය කරයි.

(අවස්ථා සිද්ධි ගෙන විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.)